සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

06 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | 62 S

නම: ............................................ **භූගෝල විද්‍යාව** කාලය පැය දෙකයි

## I කොටස

I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා හිස්තැන මත ලියන්න.

01) අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේදී භාවිතා වන ක්‍රමවේදයන් ලෙස භාවිතය අවම කිරීම, නැවත භාවිතා කිරීම හා .............................................................. කිරීම 3R ලෙස හැඳින්වේ.
(අලුත්වැඩියා, ප්‍රතිචක්‍රීකරණය, ඇසුරුම්කරණය)

02) මැඩගස්කර් දූපත...................................................... පිහිටා ඇත.
(ඉන්දියන් සාගරයේ, අත්ලන්තික් සාගරයේ, පැසිෆික් සාගරයේ)

03) ශ්‍රී ලංකාවේ ................................................ පළාත දිස්ත්‍රික්ක තුනකින් සමන්විත පළාතකි.
(උතුරු, දකුණු, වයඹ)

04) සුළඟේ වේගය මැනීම සඳහා........................................... භාවිතා වේ.
(සුළං දිශා දර්ශකය, අනිලමානය, පීඩන මානය)

05) ශ්‍රී ලංකාවේ රජය මැදිහත් වී නොමිලේ ලබාදෙන සේවාවක් ලෙස ............................................. හැඳින්විය හැක.
(ප්‍රවාහන සේවය, සෞඛ්‍ය සේවය, තැපැල් සේවය)

- **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.**

06) ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි කුඩාම දිවයිනයි. (............)

07) ඉවතලන අපද්‍රව්‍ය භාවිතා කර කළ හැකි විකල්ප බලශක්ති උත්පාදන ක්‍රමයක් ලෙස ජීව වායු ඒකකය හැඳින්විය හැකිය. (............)

08) ආලෝක විමෝචන ඩයෝඩ භාවිතයෙන් නිර්මාණය කර ඇති විදුලි බල්බය විදුලි පරිභෝජනය අධිකව සිදුවන බල්බ වර්ගයකි. (............)

09) ඉන්ධනයක් ලෙස දර භාවිතය පරිසර දූෂණය අධික ශක්ති ප්‍රභවයකි. (............)

10) වායු දූෂණය නිසා ස්වසන පද්ධතිය ආශ්‍රිතව ඇතිවන රෝගයක් ලෙස පෙනහලු පිළිකා හැඳින්විය හැකිය. (............)

- 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11) අවිධිමත් භූමි පරිහරණයේ ප්‍රතිඵලයක් නොවන පිළිතුර තෝරන්න.
   I. පාංශු ඛාදනය අවමවීම.
   ii. පරිසර පද්ධති විනාශ වීම.
   iii. නායයෑම් ඇතිවීම.
   iv. සත්ත්ව වාසස්ථාන අහිමිවීම.

12) අප භාවිතා කරන සේවාවන් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   i. කෘෂිකර්මය, කර්මාන්ත, සෞඛ්‍ය
   ii. අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය
   iii. තැපැල්, සන්නිවේදන, ගෘහ කර්මාන්ත
   iv. සත්ව පාලනය, අධ්‍යාපනය, ආරක්ෂාව



LIVEWORKSHEETS

13) ශ්‍රී ලංකාවේ දුම්බර ප්‍රදේශය ප්‍රසිද්ධියක් උසුලන්නේ,

i. වේවැල් භාණ්ඩ සඳහාය. ii. වෙස්මුහුණු කර්මාන්තය සඳහාය.
iii. පිත්තල භාණ්ඩ සඳහාය. iv. පැදුරු සඳහාය.

14) ශ්‍රී ලංකාවේ වැඩිම ප්‍රතිශතයක් ජීවත්වන ආගමික කණ්ඩායම වනුයේ,

i. කතෝලිකය. ii. හින්දුය. iii. ඉස්ලාමිය. iv. බෞද්ධය.

15) මිනිසාට ලෙඩ රෝග බෝකරන සතුන් පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද?

i. නයා, පොළගා ii. මදුරුවා, මීයා iii. මී මැස්සා, සමනලයා iv.බකමූණා, වවුලාය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16) දිශාව හඳුනාගැනීම සඳහා භාවිතා වන උපකරණය ........................................ ලෙස හැඳින්වේ.

17) ශ්‍රී ලංකාවේ පිත්තල භාණ්ඩ නිෂ්පාදනයට ................................................ ප්‍රදේශය ප්‍රසිද්ධය.

18) කාලගුණික අංග අතර මූලිකාංගය වන්නේ ............................................ යි.

19) ශීත රටවලින් දැඩි සීතල දරාගැනීමට නොහැකිව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂි විශේෂයක් ලෙස ................................................. හැඳින්වීමට පුළුවන.

20) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වී ඇත්තේ .................................................... සන්ධියෙනි.



LIVEWORKSHEETS